# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2051/16 – 2017 දෙසැම්බර් මස 27 වැනි බදාදා – 2017.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු මැද පළාතේ පළාත් සභාව

2017 අංක 03 දරන උතුරු මැද පළාත් බදු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාතේ, පළාත් සභාව විසින් සම්මත කොට 2017 දෙසැම්බර් මස 14 වැනි දින උතුරු මැද පළාතේ පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් සහතික කරන ලද පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

එච්. එල්. එස්. විජේසිංහ,
ලේකම්,
උතුරු මැද පළාත් සභාව.

2017 දෙසැම්බර් මස 19 වැනි දින,
උතුරු මැද පළාත් සභාවේ දී ය.



මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උතුරු මැද පළාතේ පළාත් සභාවේ 2017 අංක 03 දරන උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය**

උතුරු මැද පළාත තුළ උකස්ගන්නන්ගේ ව්‍යාපාරයේ කටයුතු විධිමත් කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තිය 1942 අංක 13 දරන (90 වන අධිකාරිය වූ) උකස්ගන්නන්ගේ ආඥාපනතේ විධිවිධාන හා අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:–

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. (මෙහි මින් මතු ''ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාත් සභාවේ 2017 ...... දරන උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර (මෙහි මින් මතු ආණ්ඩුකාරවරයා යනුවෙන් සඳහන් කරනු ලබන) උතුරු මැද පළාතේ ආණ්ඩුකාරවරයා විසින් ප්‍රඥප්තිය සහතික කරන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය :–

ප්‍රඥප්තිය අදාළ කර ගැනීම

2. මේ ප්‍රඥප්තියේ විධිවිධාන උතුරු මැද පළාතේ බැංකුවක් නොවන යම් තැනැත්තෙකු විසින් කරගෙන යනු ලබන උකස්ගන්නන්ගේ ව්‍යාපාරයට අදළ කර ගනු ලැබිය යුතු ය.

## I වන කොටස

### ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර ලබා දීම

උකස්කරුවකු ලියාපදිංචි කිරීම

3. (මෙහි මින් මතු ''පළාත් ආදායම් කොමසාරිස්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) උතුරු මැද පළාතේ, පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් උකස්කරුවකු ලෙස ලියාපදිංචි කර ඇති යම් තැනැත්තෙකු විසින් මිස වෙනත් කිසිදු තැනැත්තකු විසින් උකස්ගන්නකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම නොකළ යුතු ය.

ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීම.

4. (1) උකස්ගන්නකුගේ ව්‍යාපාරයක් කරගෙන යාමට අදහස් කරන සෑම තැනැත්තකුම නිශ්චිත ගාස්තු සමග වූ නියමිත ආකෘති පත්‍රයකින් ලියාපදිංචිය සඳහා පළාත් ආදායම් කොමසාරිස්වයා වෙත ඉල්ලුම් කළ යුතු ය.

එසේ වුව ද ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු හෝ විදේශීය සමාගමක් හෝ විදේශීය ආයතනයක් (මෙහි මින් මතු ''පළාත'' යනුවෙන් සඳහන් කරනු ලබන) උතුරු මැද පළාත තුළ උකස්ගන්නකු ලෙස ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

(2) යම් තැනැත්තකු

(අ) වෙන්දේසිකරුවකු වේ නම්;

(ආ) ලියාපදිංචිය සඳහා ඔහු ඉල්ලීම ඉදිරිපත් කරන දිනය පෙරාතුවම ඉක්බිති වසර පහක කාල සීමාව තුළ අවස්ථාවක දී ඔහු වරදකට වරදකරුවකු වී ඇති බව සොයාගෙන ඇත්නම්; හෝ

(ඇ) උකස්ගැනීමේ ව්‍යාපාරය කරගෙන යාමට ඔහු අදහස් කරන සාප්පුව හෝ ස්ථානය හෝ ඔහුට අයිති යම් යාබද නිවසක් හෝ ස්ථානයක් උකස් ගන්නකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා සුදුසු නොවන බවට පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ මතය වේ නම්,

එවැනි කිසිදු තැනැත්තකු උකස්ගන්නකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ලියාපදිංචි කිරීම නොකළ යුතු ය.

උකස්ගන්නකුගේ ව්‍යාපාරයකට බලපත්‍ර ලබා දීම

5. (1) ප්‍රඥප්තිය ආරම්භ වන දිනයේ දී සහ ඉන් පසුව, 4 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද කිසිදු තැනැත්තකු, ඒ කාර්යය සඳහා පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරි බලය යටතේ මිස උකස්ගන්නකුගේ යම් ව්‍යාපාරයකට සම්බන්ධ නොවිය යුතු ය.

(2) 4 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද සෑම තැනැත්තකුම වෙන් වෙන්ව ඉල්ලුම් පත්‍රයක් භාර දිය යුතු අතර සියලු ව්‍යාපාර ස්ථානයන් සහ ඒ ව්‍යාපාර ස්ථානවල ශාඛා සඳහා වෙන් වෙන් වූ බලපත්‍රයක් ලබා ගත යුතු ය.

(3) සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන දිනයේ දාතම යෙදිය යුතු අතර ඊළඟ සහතික කිරීමේ දිනය වන දෙසැම්බර් තිස්එක්වෙනි දිනයෙන් අවසන් විය යුතු ය.

(4) පළාත් ආදායම් කොමසාරිස්වරයාට, (1) වන උප වගන්තිය යටතේ ඔහුගේ බලය යම් බලයලත් නිලධාරියකුට ලියවිල්ලකින් පැවරීමට බලය තිබිය යුතු ය.

6. (1) 5 වන වගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලීමක්ම නිශ්චිත ආකෘතියකින් පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. බලපත්‍ර සඳහා ඉල්ලුම් කිරීම සහ ඒ ඉල්ලුම් පත්‍රය සකස් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ භාරදෙන ලද සෑම ඉල්ලීමක්ම අවශ්‍ය කරන සියලු කරුණුවල සම්පූර්ණ සහ නිවැරදි තොරතුරු ඇතුළත් විය යුතු අතර නිශ්චිතවම සඳහන් කරන ලද ගාස්තුවලින් සමන්විත විය යුතුය.

(3) (අ) යම් තැනැත්තෙකු විසින් කරගෙන යන උකස්ගන්නකුගේ ව්‍යාපාරයක් ඔහුගේ මරණින් පසු වෙනත් යම් තැනැත්තෙකුට ඒ ව්‍යාපාරය අයිතිය පැවරීමට ඔහු අදහස් කරන අවස්ථාවක දි ඒ තැනැත්තා විසින් ඒ ආදේශකයා නම් කිරීමේ දී 4 වන වගන්තියේ විධිවිධානවලට යටත් විය යුතුය.

(ආ) ඒ පත්කළ තැනැත්තාගේ අයිතිවාසිකම් සහ බැදීම් ඇතුළත් ලේඛනයක් (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් සමග සමන්විත විය යුතුය. ඒ ලේඛනය දෙපාර්ශවයම විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. පුද්ගල මණ්ඩලයක් විසින් කරගෙන යනු ලබන අවස්ථාවක දී ඒ පුද්ගල මණ්ඩලය විසින් උකස්ගන්නන්ගේ ව්‍යාපාරයට බලපාන සහතිකය හෝ ගිවිසුමක පිටපත් භාරදිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ භාරදෙන ලද ඉල්ලුමක ඇතුළත් කරන ලද තොරතුරු සහ විස්තර සැලකිල්ලට ගැනීමෙන් පසු 4 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමට අදාළ යැයි නිශ්චිත කරන ලද නියමයන් ඉල්ලුම්කරු සම්පූර්ණ කර ඇති බවට පළාත් ආදායම් කොමසාරිස්වරයා සෑහීමකට පත්වන අවස්ථාවක දී, ඔහු විසින් I වන උපලේඛනයේ දක්වා ඇති ''අ'' ආකෘතියෙන් ඒ බලපත්‍රය නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) අසත්‍ය නොමඟ යවන සුළු හෝ සාවද්‍ය තොරතුරු හෝ කරුණු ඇතුළත් යැයි සොයාගත් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

7. (1) ඉක්බිතිව ම බලපත්‍රය ලැබුණ පසු එහෙත්, උකස්ගන්නන්ගේ ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙරාතුව, පළාත් ආදයම් කොමසාරිස්වරයා වෙත නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් ඇපයක් ලෙස නිශ්චිත මුදලක් තැන්පත් කළ යුතු ය. ඇප

(2) ව්‍යාපාරය නිමා කරන හෝ පවරන අවස්ථාවක දී (1) වන උපවගන්තියේ නියමයන්ට අනුව තැන්පත් කරන ලද මුදලක්, ඒ බඩු උකස්ගන්නා විසින් භාණ්ඩ උකස් කළ තැනැත්තාට ගෙවිය යුතු යම් මුදලක් අඩුකර ගැනීමෙන් පසුව ඒ බඩු උකස්ගන්නාට ආපසු ගෙවිය යුතුය.

8. 6 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් බලපත්‍රයේ ආකෘතිය සහ වලංගු කාල සීමාව

(අ) ඒ බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති යම් නියමයන්ට සහ කොන්දේසිවලට යටත් විය යුතුය.

(ආ) බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් දිනයක දී බලාත්මක භාවයට එළඹිය යුතුය; සහ

(ඇ) කලින් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබ ඇත්නම් මිස, බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් කාල සීමාවක් සඳහා බලාත්මක විය යුතු ය.

9. (1) බලපත්‍රය නිකුත් වන දිනයට පෙරාතුව දින තිහකට නොඅඩු කාල සීමාවක දී නිශ්චිත කරන ලද අලුත් කිරීමේ ගාස්තු සමග නිශ්චිත ආකෘතියකින් තත්කාර්යය සඳහා පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක් භාරදීමෙන් පසු බලපත්‍රය අලුත් කරනු ලැබිය හැකිය. බලපත්‍රයක් අළුත් කිරීම.

(2) ඉක්බිතිව ම පෙරාතුව වූ මූල්‍ය වර්ෂය සඳහා එවැනි උකස්ගන්නකුගේ ව්‍යාපාරයේ වාර්ෂික ගිණුම්

ප්‍රකාශනවල පිටපතක් (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය සමග ඇමිණිය යුතුය.

(3) පළාත් ආදයම් කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු පසු,

*(අ)* බලපත්‍රලාභියා, නිකුත් කරන ලද බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි කඩ කර නොමැති හෝ ඒ නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය වන පරිදි කිසිවක් සිදු කර නොමැති අවස්ථාවක දී;

*(ආ)* බලපත්‍රලාභියා විසින් ප්‍රඥප්තියේ විධිවිධාන කිසිවක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග කිසිවක් උල්ලංඝනය කර නොමැති අවස්ථාවක දී; හෝ

*(ඇ)* උකස් බඩු ගැනීමේ ව්‍යාපාරයක් කරගෙන යාමට අදහස් කරන තැනැත්තාගේ සාප්පුව හෝ ව්‍යාපාරික ස්ථානය හෝ ඔහුට අයිති යම් යාබද නිවාසයක් හෝ ස්ථානයක් උකස් ගැනීමේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා සුදුසු යැයි පළාත් ආදයම් කොමසාරිස්වරයා ගේ මතය වන අවස්ථාවක දී;

බලපත්‍රයක් අලුත් කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ අලුත් කරන ලද බලපත්‍රයක් සම්බන්ධයෙන් 7 වන වගන්තියේ විධිවිධාන අදාළ කරගනු ලැබිය යුතු ය.

බලපත්‍රයක් අත්හිටුවීම.

10. පළාත් ආදයම් කොමසාරිස්වරයා විසින්,

*(අ)* ඒ බලපත්‍රලාභියා ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වරදක් සිදු කිරීම සඳහා චෝදනා ලැබ ඇති අවස්ථාවක දී ; හෝ

*(ආ)* බලපත්‍රලාභියා විසින් ප්‍රඥප්තියේ විධිවිධාන කිසිවක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කර ඇති අවස්ථාවක දී සහ ඒ උල්ලංඝනය කිරීමේ බරපතලකම බලපත්‍රයක් අවලංගු කිරීමේ අවසරයක් නොවන අවස්ථාවක දී,

බලපත්‍රයක් අත්හිටුවනු ලැබිය හැකි ය.

බලපත්‍රයක් අවලංගු කිරීම.

11. පළාත් ආදයම් කොමසාරිස්වරයා විසින්,

*(අ)* අසත්‍ය, නොමග යවන සුළු හෝ සාවද්‍ය තොරතුරු සපයමින් ඒ බලපත්‍රය ලබා ගෙන ඇති බවට සොයාගනු ලබන අවස්ථාවක දී ;

*(ආ)* සොරකම් කරන ලද භාණ්ඩ බලපත්‍රලාභියා විසින් තබාගෙන ඇති අවස්ථාවක දී ;

*(ඇ)* යම් ලිඛිත නීතියක් යටතේ බලපත්‍රලාභියා වරදකට වරදකරුවකු කරනු ලැබ ඇති අවස්ථාවක දී ;

*(ඈ)* බලපත්‍රලාභියා විසින් මේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කරනු ලැබ ඇති අවස්ථාවක දී ; හෝ

*(ඉ)* ඒ බලපත්‍ර නිකුත් කරනු ලැබුවේ යම් නියමයන් හෝ කොන්දේසි වලට යටත්ව ද, ඒ නියමයන් හෝ කොන්දේසි උල්ලංඝනය වන පරිදි හෝ කඩවන පරිදි ඒ බලපත්‍රලාභියා ක්‍රියාකර ඇති අවස්ථාවක දී, බලපත්‍රයක් අවලංගු කරනු ලැබිය යුතුය.

හේතු දැනුම් දිය යුතු බව.

12 (1) බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා හෝ අලුත් කිරීම සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ හේතු පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් වාර්තා කරනු ලැබිය යුතුව. ලියාපදිංචි තැපෑලෙන් යවන ලිඛිත දැනුම් දීමක් මඟින් ඒ ප්‍රතික්ෂේප කිරීමෙන් දින තිහක කාල සීමාවක් ඇතුළත පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රයක් අත්හිටුවා හෝ අවලංගු කර ඇති අවස්ථාවක දී, ලියාපදිංචි තැපෑලෙන් යවන ලිඛිත දැන්වීමක් මගින් ඒ අත්හිටු වීම හෝ අවලංගු කිරීම පිළිබඳ බලපත්‍රලාභියාට නොපමාව දැනුම්දීම පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

13. (1) බලපත්‍රයක් නිකුත්කිරීම හෝ අලුත්කිරීම ප්‍රතික්ෂේප කිරීමේ හෝ නිකුත් කරන ලද බලපත්‍රයක් අත්හිටුවීමේ හෝ අවලංගුකිරීමේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින්, ඒ ප්‍රතික්ෂේප කිරීම, අත්හිටුවීම හෝ අවලංගුකිරීම පිළිබඳ යම් තැනැත්තෙකුට දැනුම් දීමේ ලිඛිත නිවේදනය ලැබුණු දිනයෙන් මාස තුනක කාල සීමාවක් ඇතුළත (මෙහි මින් මතු ''ප්‍රධාන ලේකම්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් ප්‍රධාන ලේකම්වරයා වෙත ඒ තීරණයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. අභියාචනා

(2) (1) වන උපවගන්තිය යටතේ භාරදෙන ලද යම් අභියාචනයක් පිළිබඳව තීරණය ඒ අභියාචනය ලැබී දින හැටක් ඇතුළත සිදු කරනු ලැබිය යුතු අතර ඒ අභියාචනය ඉදිරිපත් කරන තැනැත්තාට ඒ පිළිබඳ දෙන ලද තීරණය දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) ප්‍රධාන ලේකම්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ඔහු වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන යම් අභියාචනයක් පිළිබඳව ප්‍රධාන ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය විය යුතු ය.

14. (1) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින්, යම් උකස් ව්‍යාපාරයක් කරගෙන යාමට අදහස් කරනු ලබන ප්‍රදේශය භාර පොලිස් අධිකාරිවරයාට 6 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය. පොලිස් අධිකාරිවරයාට දැනුම් දීමේ කාර්යය

(2) අවස්ථාවෝචිත පරිදි 10 වන හෝ 11 වන වගන්තිය යටතේ බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම පිළිබඳව යම් උකස් ව්‍යාපාරයක් කරගෙන යනු ලැබුවේ යම් ප්‍රදේශයක් තුල ද, ඒ ප්‍රදේශය භාර පොලිස් අධිකාරිවරයාට දැනුම්දීම පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

15. 6 වන වගන්තිය යටතේ නිකුත්කරන ලද බලපත්‍රයක් දරන්නකු පළාතත් ආදායම් කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව කිසිදු තැනැත්තෙකුට බලපත්‍රයක් පවරනු නොලැබිය යුතු ය. පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව බලපත්‍රය පැවරීම

16. පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් උකස්ගන්නන්ගේ ව්‍යාපාරය කරගෙන යනු ලබන්නේ යම් ස්ථානයක ද ඒ ස්ථානවල නම් සහ පරිශ්‍රයන්හි ලිපිනයන් ඇතුළත් දැන්වීමක් වාර්ෂිකව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය. බලපත්‍රලාභියාගේ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම

## II වන කොටස

### උකස්කරුවන්ගේ බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්

17. මාස තුනක් ඉක්මවන යම් කාල සීමාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමට අරමුණු කරන සෑම උකස්කරුවකුම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම පිළිබඳ දැන්වීම

*(අ)* ඔහුගේ නොපැමිණීම පිළිබඳව පළාත් ආදායම් කොමසාරිස්වරයාට ලිඛිත දැන්වීමක් ලබා දිය යුතු අතර ඒ කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතිය ලබාගත යුතු ය.

*(ආ)* ඔහු බැහැරව සිටින කාලය තුළ දී ව්‍යාපාරය කරගෙන යාමට තැනැත්තකු පත්කළ යුතු ය.

18. කිසිදු උකස්ගන්නකු විසින් යම් දිනයක පෙරවරු 8.00ට පෙරාතුව සහ පස්වරු 8.00ට පසුව උකස්කිරීම සඳහා කිසිදු භාණ්ඩයක් භාර නොගත යුතු ය. උකස්ගන්නෙකුගේ ගනුදෙනු වේලාවන්

උකස්ගන්නකු වෙන්දේසිකරුවකු ලෙස ක්‍රියා නොකළ යුතුය.

19. කිසිදු උකස්ගන්නකු විසින් වෙන්දේසිකරුවකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම නොකළ යුතු ය.

උකස් ගන්නා විසින් ප්‍රදර්ශනය කළ යුතු දැන්වීම්.

20. සෑම උකස්ගන්නකු විසින්ම,

(අ) ඔහුගේ ව්‍යාපාරික නාමය, බලපත්‍රයේ ලියාපදිංචි අංකය සහ ''උකස්ගන්නා'' යන වචනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් ඔහුගේ සාප්පුවේ හෝ ව්‍යාපාරික ස්ථානයේ පිටත දොරටුවේ කියවිය හැකි අකුරෙන් ප්‍රදර්ශනය කළ යුතුය; සහ

(ආ) II වන උපලේඛනයේ දක්වා ඇති තොරතුරු ඇතුළත් කරමින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවෙන් දැන්වීමක් ඔහුගේ ව්‍යාපාරික ස්ථානයේ ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතුය.

උකස්ගන්නන් විසින් පවත්වාගෙන යායුතු පොත්, දත්ත, ආකෘති හෝ ලේඛන.

21. (1) යම් පොත්වල, දත්තවල, ආකෘතිවල හෝ ලේඛනවල යම් තොරතුරු ප්‍රඥප්තියෙන් ඇතුළත් කිරීමට නියම කරන අවස්ථාවක දී, ඒ තොරතුරු සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(2) සෑම උකස්ගන්නකු විසින්ම I වන උපලේඛනයේ දක්වා ඇති පරිදි ''ආ'' ආකෘතියෙන් ඔඩපන පොතක් සහ ''ඇ'' ආකෘතියෙන් ඔඩපන විකුණුම් පොතක් පවත්වාගෙන යා යුතු ය.

(3) (2) වන උපවගන්තියේ දක්වා ඇති ලේඛන භාර දීමට නියම කර ඇත්නම්, පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත (2) වන උපවගන්තියේ දක්වා ඇති ලේඛන භාර දීමට උකස්ගන්නකුගේ කාර්යය විය යුතු ය.

උකස් කුවිතාන්සිය.

22. (1) සෑම උකස් කුවිතාන්සියක් ම I වන උපලේඛනයේ දක්වා ඇති ''ඇ'' ආකෘතියේ ආකාරයට ලියා අත්සන් කළ යුතු ය.

(2) මේ ප්‍රඥප්තියේ II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති තොරතුරු I වන උපලේඛනයේ ''ඇ'' ආකෘතියේ පසුපිටේ සිංහල හෝ දෙමළ භාෂාවෙන් කියවිය හැකි ලෙසින් මුද්‍රණය කළ යුතු ය.

(3) උකස, ඔඩපනයක් වන අවස්ථාවක දී, ඒ ඔඩපනයට අදළ උකස් කුවිතාන්සි පත්‍රිකාවේ, කුවිතාන්සියේ නිශ්චිතව දක්වා ඇති වටිනාකමට අදළ මුද්දර ගාස්තු දැරිය යුතු ය. ඒ මුද්දර සැපයීමේ දී දරන ලද වියදම් බඩු උකස්ගන්නා විසින් දැරිය යුතු ය.

(4) උකස් කිරීම සඳහා යම් භාණ්ඩයක් ගෙන යන අවස්ථාවක දී,

(අ) බඩු උකස්කරන්නා උකස් කුවිතාන්සි පිළිපතේ අත්සන් කළ යුතු ය;

(ආ) බඩු උකස්ගන්නකු විසින් උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාවේ අත්සන් කළ යුතු අතර බඩු උකස් කරන්නාට පිළිපත ලබා දිය යුතු ය;

(ඇ) බඩු උකස්ගන්නා විසින් මුල් පත්‍රිකාව සහ පිළිපත භාරගත යුතු ය;

(ඈ) බඩු උකස්ගන්නා විසින් උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව ලබා දිය යුතු ය;

(ඉ) වාර්ෂික පොළිය උකස් කුවිතාන්සියේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

පොළිය.

23. කිසිදු බඩු උකස්ගන්නකු විසින් II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන පොළී මුදලක් අයකර ගනු නොලැබිය යුතු ය.

එසේ වුවද, ඔඩපනයක් වෙනුවෙන් දෙන ලද ණයක් සම්බන්ධයෙන් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් ගෙවිය යුතු අවස්ථාවක දී මේ වගන්තියේ කලින් ඇතුළත් කරන ලද කිසිවකින් බඩු උකස්කරන්නාගෙන් ඒ බද්ද ආපසු අයකර ගැනීමෙන් බඩු උකස්ගන්නා වැළැක්වීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

## II වන කොටස

### ඔඩපනය

24. සෑම ඔඩපනයක්ම උකස් කළ දිනයේ සිට ඒ දිනය ද ඇතුළුව (මෙහි මින් මතු ''බේරුම් කිරීමේ කාල සීමාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) මාස දෙළහක කාල සීමාවක් තුළ දී බේරුම් කරනු ලැබිය යුතු ය. බේරුම් කිරීමේ කාල සීමාව.

25. ප්‍රඥප්තියට එරෙහිව කුමක් සඳහන් වුවද, බේරුම් කිරීමේ කාල සීමාව ඉකුත් වී ඇතත් ප්‍රඥප්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි ඒ ඔඩපනය අලෙවි කරන තෙක් සෑම ඔඩපනයක්ම නොකඩවා බේරුම් කරනු ලැබිය හැකි ය. ඔඩපනය අලෙවි කරන තෙක් නොකඩවා බේරුම් කළ හැකි බව.

26. (1) බඩු උකස් කරන්නා විසින් ඒ ඔඩපනයට අදල උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව බඩු උකස්ගන්නා වෙත ඉදිරිපත් කර ඇත්නම් සහ බඩු උකස්ගන්නා හෝ ඔහුගේ අනුයෝජිතයකු හෝ සේවකයකු ඉදිරිපිට දී ඔහු විසින් ඒ පත්‍රිකාව අත්සන් කර ඇත්නම් ඔඩපනය බේරුම් කිරීමට බඩු උකස්කරන්නා හිමිකම් ලැබිය යුතු ය. ඔඩපනයක් බේරුම් කිරීම සඳහා වූ ක්‍රියා පටිපාටිය.

(2) බඩු උකස්කරන්නකු නොවන තැනැත්තකු වන විට දී ඒ තැනැත්තා විසින් බඩු උකස් කරන්නාගේ අත්සන සමඟ නිසි ලෙස පිටසන් කරන ලද ඒ ඔඩපනයට අදල උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව බඩු උකස්ගන්නා වෙත ඉදිරිපත් කර ඇත්නම්, සහ බඩු උකස්කරන්නා නොවන තැනැත්තා බඩු උකස්කරන්නා හෝ ඔහුගේ අනුයෝජිතයකු හෝ සේවකයකු ඉදිරිපිට දී ඒ පත්‍රිකාව අත්සන් කර ඇත්නම්, ඒ බඩු උකස්කරන්නකු නොවන තැනැත්තා ඔඩපනයක් බේරුම් කිරීමට හිමිකම් ලැබිය යුතු ය.

(3) බඩු උකස්කරන්නාගේ මරණය හෝ අශක්නුතාවයක් හේතුවෙන් ඔඩපනයට අදාල උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව දරන්නා ඒ ඔඩපනය බේරුම් කිරීමට හිමිකම් ලැබිය යුතු මුත්, බඩු උකස්කරන්නා විසින් නිසි ආකාරයෙන් පිටසන් කර අත්සන් කරන ලද උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව බඩු උකස්ගන්නා වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වන අවස්ථාවක දී උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව දරන ඒ තැනැත්තා විසින් සාමදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු ඉදිරිපිට දී නිසියාකාරයෙන් අත්සන් කරන ලද 1 වන උපලේඛනයේ ''ඉ'' ආකෘතියෙන් වූ ප්‍රකාශනයක් සමඟ ඒ ඔඩපනයට අදාල උකස් කුවිතාන්සියේ එකී මුල් පත්‍රිකාව බඩු උකස්ගන්නා වෙත ඉදිරිපත් කර ඇත්නම් බඩු උකස් ගන්නා විසින් ඒ ඔඩපනය බේරුම් කිරීමට අවසර දිය යුතු ය.

(4) (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව ණය, ඒ ණය මත අය විය යුතු පොළිය සහ ඒ ණය සම්බන්ධයෙන් ගෙවිය යුතු ව්‍යාපාර පිරවැටුම් බද්දක් වේ නම් එය ගෙවීමෙන් පසු බඩු උකස් ගන්නා විසින් ඒ ඔඩපනයට බඩු උකස්කරන්නාට හෝ ඒ ඔඩපනයට අදාල උකස් කුවිතාන්සිය දරන්නාට භාරදිය යුතු අතර බඩු උකස්ගන්නා ඒ ඔඩපනය භාර දීම සම්බන්ධයෙන් මෙයින් හානි පූර්ණය කරනු ලැබේ:

එසේ වුවද, උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව දරන්නා විසින් එහි සන්තකය නීති විරෝධී ලෙසින් ලබා ගෙන ඇති බවට සැක කිරීමට බඩු උකස්ගන්නා තැනැත්තාට සැක කිරීමට හේතු ඇත්නම් බඩු උකස් ගන්නා තැනැත්තා විසින් ඒ කරුණු පිළිබඳව ආසන්නම පොලිස් ස්ථානයට නොපමාව දැනුම් දිය යුතු ය.

27. ඔඩපනයක් බේරුම් කිරීමට හිමිකම ලබන සහ ඉදිරිපත් වන තැනැත්තකු විසින් බඩු උකස්ගන්නා තැනැත්තාගේ පැහැර හැරීමක්, නොසලකා හැරීමක් හෝ හිතාමතා සිදු කරන දුශ්චර්යාවක් නිසා හෝ එවැනි හේතුවක් මගින්, ඔඩපනය උකස් කරන කාල සීමාවේ දී, එහි තිබූ වටිනාකම අඩු වී ඇති බව හෝ අඩු වෙමින් පවතින බවට සිවිල් අධිකරණයක් ඉදිරිපිට දී හේතු දක්වා ඇතිනම්,අධිකරණය විසින් ඔඩපනය අයිතිකරු සෑහීමකට ඔඩපනය ක්ෂයවීම වෙනුවෙන් වන්දි ගෙවීම

පත් වන ලෙසට සාධාරණ වන්දියක් ප්‍රදානය කිරීම සුදුසු යැයි සිතන්නේ නම් ඒ වන්දි මුදල බඩු උකස් ගන්නාට ගෙවිය යුතු මුදලින් අඩු කරනු ලැබිය යුතුය. නැතහොත් අධිකරණය විසින් නියෝග කරනු ලැබිය හැකි යම් ආකාරයකින් බඩු උකස් ගන්නා විසින් ගෙවනු ලැබිය යුතු ය.

**කුවිතාන්සියක් නොමැති අයිතිකරුවන් සහ බඩු උකස් කරන්නන් ආරක්ෂා කිරීම.**

28 (1) උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාවක් නොදරන, එහෙත් ඔඩපනයක අයිතිකරු ලෙස හිමිකම්පාන යම් තැනැත්තකු හෝ උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව දැරීමට හිමිකම් පෑමට ඉල්ලා සිටින, එහෙත් උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව නැති වී, සොරාගෙන අවුල් සහගතව විනාශ වී හෝ වංචනික ලෙස ඔහුගෙන් සොරා ගෙන ඇතැයි කියන ලද යම් තැනැත්තකු විසින් සාමදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු ඉදිරිපිට දී I වන උපලේඛනයේ "ඊ" ආකෘතියෙන් නිසියාකාරයෙන් සිදු කරන ලද ප්‍රකාශයක් බඩු උකස්ගන්නා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

එසේ වුවද, ඔඩපනයක් බේරුම් කිරීමේ කාර්යය සඳහා ඔහු විසින් 26 වන වගන්තියෙන් නියම කර ඇති පරිදි ඔඩපනයක් උකස් කුවිතාන්සියේ පිළිපත අත්සන් කළ යුතු ය.

(2) ඒ ප්‍රකාශයේ යම් වැදගත් කරුණු වංචනික හෝ සාවද්‍ය බවට ඔහු විසින් විද්‍යාමානව හෝ ව්‍යුහාත්මකව දැනුම් දී ඇත්නම් මිස ප්‍රකාශනයට අනුකූලව ඔඩපනය භාර දීමේ දී හෝ අන්‍යාකාරයකින් ක්‍රියා කිරීමේ දී බඩු උකස්ගන්නා මෙයින් හානිපූර්ණය කරනු ලැබේ.

**ඔඩපනය බේරුම් කිරීමෙන් හෝ විකිණීමෙන් පසුව බඩු උකස්කන්නා විසින් උකස් කුවිතාන්සිය රඳවා ගතයුතු බව.**

29 (1) ඔඩපනයක් බේරුම් කිරීමේ කාර්යය සඳහා උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව බඩු උකස්ගන්නා වෙතට ඉදිරිපත් කරන අවස්ථාවක දී, බඩු උකස් ගන්නා විසින් ඒ ඔඩපනය බේරුම් කිරීමේ දින සිට ගණන් ගන්නා වසරු දෙකක කාල සීමාවක් සඳහා උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව සහ උකස් පත්‍රිකාවේ පිළිපත ඔහු සන්තකයේ රඳවා ගත යුතු ය.

(2) උකස් කුවිතාන්සි පත්‍රිකාව ඉදිරිපත් කිරීමෙන් තොරව ඔඩපනයක් බේරුම් කර ගන්නා අවස්ථාවක දී බඩු උකස්ගන්නා විසින් ඒ ඔඩපනය බේරුම් කරන දින සිට ගණන් ගැනෙන වසර දෙකක කාල සීමාවක් සඳහා ඔඩපනයට අදාල උකස් කුවිතාන්සියේ පිළිපත සහ 28 වන වගන්තිය යටතේ ඔහු වෙත ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය ඔහුගේ සන්තකයේ රඳවා තබා ගත යුතුය.

(3) ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ඔඩපනයක් විකුණන අවස්ථාවක දී බඩු උකස්ගන්නා විසින් ඒ විකුණුම් දිනයේ සිට ගණන් ගැනෙන මාස දොළහක කාල සීමාවක් සඳහා ඔඩපනයට අදාල උකස් කුවිතාන්සියේ පිළිපත ඔහු සන්තකයේ තබා ගත යුතු ය.

**ගින්නක් ස්වාභාවික ආපදවක් හෝ වෙනත් යම් ප්‍රතිඵලයක් හේතුවෙන් ඔඩපනයේ පාඩුව සම්බන්ධයෙන් බඩු උකස් ගන්නාගේ වගකීම.**

30 (1) ගින්නක්, ස්වභාවික අපාදාවක් හෝ වෙනත් යම් හේතුවකින් හෝ එවැනි ගින්නක්, ස්වභාවික අපාදාවක් හෝ යම් හේතුවක ප්‍රතිඵලයක් ලෙස ඔඩපනයක් නැති වීම හෝ විනාශ වීම හෝ හානි වන අවස්ථාවක දී බඩු උකස්ගන්නා විසින් බේරුම් කිරීමේ කාල සීමාව ඇතුළත ණය මුදල සහ පොළිය සහ ඒ ණය සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් වේ නම් එය අඩු කිරීමෙන් පසුව ඉල්ලූ විගස ඔඩපනයේ වෙළඳපල වටිනාකම ගෙවීමට යටත් විය යුතුය.

(2) සෑම බඩු උකස්ගන්නකු විසින්ම උකස් කර ඇති භාණ්ඩවල සම්පූර්ණ වටිනාකම් ප්‍රමාණයට ඔහුගේ ව්‍යාපාරය රක්ෂණය කරනු ලැබ තිබිය යුතු ය.

(3) සෑම බඩු උකස්ගන්නකු විසින්ම උකස්ගන්නා ලද භාණ්ඩ ආරක්ෂිත ආකාරයකින් ගබඩා කර තැබීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

**උකස්ගන්නා විසින් සපයන ලද ඇප ආපසු ගෙවීම.**

31. 30 වන වගන්තියේ දක්වා ඇති යම් අවස්ථානුගත කාරණාවක දී හෝ යම් තැනැත්තකු බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යාම අවසන් කරන අවස්ථාවක දී, ඔහු විසින් සපයන ලද ඇප මුදලින් එවැනි වන්දියක් ගෙවීමට අදාල යම් මුදලක් අඩු කර ඇප මුදල ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතු ය.

**බඩු උකස්ගන්නාගේ කුවිතාන්සිය.**

32. සෑම බඩු උකස්ගන්නකු විසින්ම ඔඩපනය බේරුම් කරන කාල සීමාවේ දී ණය මුදල සහ ඔහුට ගෙවිය යුතු පොළිය වෙනුවෙන් කුවිතාන්සියක් නිකුත් කළ යුතු අතර, ඔහුගෙන් අයවිය යුතු යම් බදු මුදලක් වේ නම් ඒ කුවිතාන්සියේ පිටපතක් ඔඩපන පොතේ සුරක්ෂිතව රඳවා තැබිය යුතුය. ඒ කුවිතාන්සිය I වන

උපලේඛනයේ ඇති ''උ'' ආකෘතියේ ආකාරයෙන් තිබිය යුතු ය.

33. (1) බේරුම් කිරීමේ කාල සීමාව තුල දී බේරා නොගත් සෑම ඔඩපනයක් III වන උපලේඛනයේ නියමයන්ට අනුව ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණීමෙන් බැහැර කරනු ලැබිය හැකි ය. ඔඩපනය වෙන්දේසි කිරීමකින් විකිණිය හැකි බව.

(2) ඔඩපනයක් ප්‍රසිද්ධ වෙන්දේසියක් මඟින් විකිණිය හැකි අවස්ථාවක දී, බඩු උකස්ගන්නා විසින් ඒ විකිණීමේ දිනය සහ නියම කරගත් වේලාව සහ ඒ විකිණීම පැවැත්විය යුතු ස්ථානය පිළිබඳව පළාත් ආදායම් කොමසාරිස්වරයාට දින හැටක් තුළ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ඔහුගේ තීරණය පිළිබඳව ඒ විකිණීමට දින විසි එකකට පෙරාතුව බඩු උකස්ගන්නා වෙත දැනුම් දිය යුතු ය.

(3) බඩු උකස්ගන්නකුගේ ඔඩපනයක් විකිණිය යුතු අවස්ථාවක දී, ඒ විකිණීමට දින දාහතරකට පෙරාතුව ලියාපදිංචි තැපෑලෙන් ඒ බඩු උකස් කල තැනැත්තාට දැනුම් දිය යුතු ය.

34. (1) ණය මුදල සහ විකුණන දිනය වන විට අයවිය යුතු පොළිය සහ ඒ ණය මුදල සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් බඳු මුදලකට වඩා වැඩි මුදලකට ඔඩපනයක් විකුණන අවස්ථාවක දී, බඩු උකස්ගන්නා විසින්, ණය මුදල පොළිය සහ ව්‍යාපාර පිරිවැටුම් බදු මුදලට වඩා වැඩි මුදලකට ඔඩපනය විකිණීම පිළිබඳ ක්‍රියාපටිපාටිය.

(අ) ඒ ඔඩපනය උකස් කළ තැනැත්තාට, ඒ ඔඩපනය විකුණුවේ කොපමණ මුදලකට ද ඒ මුදල් ප්‍රමාණය සහ අත්‍යවශ්‍ය විකිණීමේ ගාස්තු සහ පිරිවැය අඩු කිරීමෙන් පසුව බඩු උකස් කළ තැනැත්තාගේ බැරට පවතින මුදල් ප්‍රමාණය පිළිබඳ දැනුම් දිය යුතු ය.

(ආ) ඒ ඔඩපනය අදාල උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව දරන්නාට, ඒ විකිණීමේ දින සිට වසරක් ඇතුළත ඉල්ලූ විගස බඩු උකස්කරන්නාගේ බැරට පවතින මුදල ගෙවිය යුතු ය.

(ඇ) එය විකිණීමේ දින සිට වසරක කාල සීමාවක් ඇතුළත එවැනි ඉල්ලීමක් සිදු කර නොමැති නම්

බඩු උකස්කරන්නාගේ බැරට පවතින ඒ මුදල් ප්‍රමාණය පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත තැන්පත් කළ යුතු ය.

(2) පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත මුදල් තැන්පත් කිරීමෙන් පසුව නොපමාව බඩු උකස්කරන්නා වෙත දැනුම් දිය යුතු ය.

(3) බඩු උකස්කරන්නා විසින් විකිණීමේ දින සිට වසර දෙකක කාල සීමාවක් ඇතුළත පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන අවස්ථාවක දී දෙවෙනියට සඳහන් කළ තැනැත්තා විසින් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව දරන්නාට දින තිහක් ඇතුළත ඒ මුදල ගෙවීමට අවශ්‍ය පියවර ගත යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වසර දෙකක කාල සීමාවක් තුළ එවැනි ඉල්ලීමක් සිදු කර නොමැති අවස්ථාවක දී ඒ මුදල (මෙහි මින් මතු ''අරමුදල'' යනුවෙන් සඳහන් කරනු ලබන) උතුරු මැද පළාත් සභා අරමුදල පවරනු ලැබිය යුතු ය.

(5) ඒ විකිණීමේ දින සිට වසර දෙකක කාල සීමාවන් ඉකුත්වීමෙන් පසුව කිසිදු ඉල්ලීමකට සවන් නොදිය යුතු ය.

35. බඩු උකස්ගන්නා වෙත උකස්කරන ලද ඔඩපනයක් වෙන්දේසියක් මඟින් විකිණීමක දී ඒ වෙන්දේසිය සඳහා සහ මිලදී ගැනීම සඳහා බඩු උකස්ගන්නා තැනැත්තකුට ලංසු තැබිය හැකි අතර, එවැනි මිලදී ගැනීමක දී, බඩු උකස්ගන්නා මිල දී ගත් ඒ ඔඩපනයේ පරම අයිතිකරු ලෙස සලකනු ලැබිය යුතු ය. බඩු උකස්ගන්නා විසින් ඔඩපනය මිල දී ගැනීම.

## IV වන කොටස
## පරීක්ෂා කිරීම, විභාග කිරීම සහ තහනමට ගැනීම

36. පළාත් ආදායම් කොමසාරිස්වරයා හෝ නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස්වරයා හෝ පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද තක්සේරුකරුවකුට, බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරයේ ගිණුම් පරීක්ෂා කිරීමට බලය තිබිය යුතු ය. ව්‍යාපාර පරීක්ෂා කිරීම.

විකුණුම් පොත පරීක්ෂා කිරීමේ බලතල.

37. ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ඔඩපනයක් විකුණනු ලබන්නේ යම් දිනයක දී ද ඒ දිනයේ සිට වසර දෙකක් ඇතුළත යම් කාල සීමාවක් තුළ දී උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව දරන්නා විසින් බඩු උකස්ගන්නන්ගේ පොතේ විකුණුම් සටහන් හෝ වෙන්දේසිකරු විසින් සහතික කරන ලද වෙන්දේසියේ විකිණීම පිළිබඳ තොරතුරු ඇතුළත් නාමාවලිය පරීක්ෂා කර බැලිය හැකිය. බඩු උකස්ගන්නා විසින් උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව දරන්නාට ඒ විකුණුම් පොතේ සටහන් හෝ නාමාවලිය පරීක්ෂා කර බැලීමට අවසර ලබා දිය යුතු ය.

උකස්කරු විසින් තමන් සතු උකස් කරනු ලබන භාණ්ඩ පිළිබඳ නිවැරදි තොරතුරු ඉදිරිපත් නොකරන විට ගත යුතු ක්‍රියාමාර්ග.

38. යම් තැනැත්තකු,

(අ) උකස් කිරීමක් සඳහා යම් භාණ්ඩයක් උකස්ගන්නකු වෙත ඉදිරිපත් කිරීමේ දී ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ එසේ ඉදිරිපත් කිරීමට නොහැකි වන අවස්ථාවක දී; හෝ

(ආ) ඒ තැනැත්තා විසින් ඒ භාණ්ඩය ඔහු සතුව පවතින්නේ කුමන ආකාරයකින් ද යන්න සෑහීමට පත්වන හේතුවක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ එසේ කිරීමට නොහැකි වන අවස්ථාවක දී; හෝ

(ඇ) හිතාමතාම බඩු උකස්ගන්නාට සාවද්‍ය තොරතුරු ලබා දෙන අවස්ථාවක දී; හෝ

(ඈ) බේරුම් කිරීම සඳහා හිමිකම් නොලබන ඔඩපනයක් බේරුම් කිරීම සඳහා තැත්කිරීම සහ උත්සාහ කිරීම; හෝ

(ඉ) උකස් කිරීමක් සඳහා භාණ්ඩයක් බඩු උකස්ගන්නා තැනැත්තකුට ඉදිරිපත් කරන අවස්ථාවක දී එය සොරකම් කරනු ලැබ ඇති බවට හෝ අන්‍යාකාරයකින් නීති විරෝධී ලෙස ලබා ගෙන ඇති බවට සැක කිරීමට බඩු උකස්ගන්නාට හේතු පවතින අවස්ථාවක දී;

බඩු උකස්ගන්නා විසින් ඒ තොරතුරු සම්බන්ධයෙන් කටයුතු කිරීමට ආසන්නම පොලිස් ස්ථානයට දැනුම් දෙනු ලැබිය හැකි ය.

බඩු උකස්ගන්නාගේ සාප්පුව හෝ නිවස සෝදිසි කිරීමේ බලතල.

39. (1) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් බලය දෙන ලද යම් නිලධාරියකු විසින් යම් බඩු උකස්ගන්නකුගේ සාප්පුවට හෝ ව්‍යාපාරික ස්ථානයට හෝ නිවසට දවසේ ඕනෑම වේලාවක ඇතුළු වී බඩු උකස්ගන්නා වෙත, ඔඩපනය කරන ලද යම් භාණ්ඩයක් හෝ ඔහු විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත් හෝ ලේඛන කිසිවක් පරීක්ෂා කර සටහන් කර ගැනීම නීත්‍යානුකූල විය යුතුය. පොලිස් සහාය අවශ්‍ය වේ යැයි පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ මතය වේ නම් එසේ බලය දෙන ලද නිලධරයකු හෝ නිලධරයන් විසින් පොලිස් නිලධරයකු කැටුව යා හැකි ය.

(2) කිසිදු තැනැත්තකු විසින් එවැනි කාර්යයන් ක්‍රියාත්මක කරන එවැනි යම් නිලධරයකුට ප්‍රතිරෝධයක් නොදැක්විය යුතු ය.

## V වන කොටස

### වැරදි සහ දණ්ඩන

බඩු උකස්කරන්නන් සහ වෙනත් තැනැත්තන් විසින් කරන වැරදි

40. යම් තැනැත්තකු විසින්,

(අ) උකස් කිරීමක් මගින් යම් භාණ්ඩයක් බඩු උකස්ගන්නකු වෙත ඉදිරිපත් කරන මුත් ඒ භාණ්ඩය ඔහු සන්තකයට පත් වූයේ යම් ආකාරයකින් ද යන්න පිළිබඳ සෑහීමට පත් විය හැකි විස්තරයක් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හෝ එසේ ලබා දීමට නොහැකි වන; හෝ

(ආ) නීත්‍යානුකූල හේතුවක් නොමැතිව වෙනත් තැනැත්තකුගේ යම් භාණ්ඩයක් බඩු උකස්ගන්නා තැනැත්තකු වෙත උකස් කිරීම; හෝ

(ඈ) යම් ඔඩපනයක් බේරුම් කිරීමට හිමිකමක් නොමැති තැනැත්තකු විසින් ඔඩපනයක් බේරුම් කිරීමට ප්‍රයත්න දැරීම හෝ උත්සහ කිරීම; හෝ

(ඇ) ප්‍රඥප්තිය යටතේ සාවද්‍ය ප්‍රකාශයක් ඉදිරිපත් කරන; හෝ

(ඉ) ප්‍රඥප්තියේ විධිවිධාන කිසිවක් උල්ලංඝනය කරන හෝ ප්‍රඥප්තිය මගින් ඔහු විසින් සිදු කිරීමට නියම කර ඇති යම් දෙයක් කිරීම පැහැර හැරීම සිදු කරයි නම් එවැනි සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු ය.

41. යම් තැනැත්තකු විසින්, — බඩු උකස්ගන්නකු විසින් සිදුකරන වැරදි.

(අ) වයස අවුරුදු දහ අටට අඩු යැයි පෙනී යන්නා වූ යම් තැනැත්තකුගෙන් උකස් කිරීමට භාණ්ඩයක් පිළිගැනීම;

(ආ) උකසක දී උකස් කුවිතාන්සියේ මුල් පත්‍රිකාව ලබා දීමෙන් තොරව භාණ්ඩයක් පිළිගැනීම;

(ඇ) උකසක දී හෝ හුවමාරුවක දී වෙනත් බඩු උකස්ගන්නා තැනැත්තකු විසින් නිකුත් කරන ලද උකස් කුවිතාන්සියක මුල් පත්‍රිකාව මිලදී ගන්නා හෝ ලබා ගැනීම;

(ඈ) උකසක දී යම් භාණ්ඩයක් භාර ගැනීමට වයස අවුරුදු දහ අටට අඩු යම් සේවකයකු සේවයේ නියුක්ත කිරීම;

(ඉ) මේ ප්‍රඥප්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියක විකිණීමක දී හැර තමා වෙත උකස් කර තිබෙන යම් ඔඩපනයක් මිල දී ගැනීම;

(ඊ) යම් ඔඩපනයක් තමා වෙත උකස් කර තිබෙන අතරතුර දී එය මිල දී ගැනීමේ අරමුණින් බේරුම් කිරීමට ඉදිරිපත් කිරීම;

(උ) යම් භාණ්ඩයක් උකස් කිරීමේ දී උකස් කිරීමට ඉදිරිපත් කිරීමේ දී, බේරුම් කිරීමේ කාල සීමාව තුළ ඒ භාණ්ඩය මිල දී ගැනීමට, විකිණීමට හෝ ඉවත් කිරීමට වෙනත් තැනැත්තකු සමඟ එකඟ වීම;

(ඌ) ප්‍රඥප්තියෙන් බලය දෙන ලද පරිදි යම් කාල සීමාවක දී සහ යම් ආකාරයකින් හැර තමා වෙත උකස් කර ඇති යම් ඔඩපනයක් විකුණන හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(එ) ප්‍රඥප්තිය යටතේ ඔහු විසින් සටහනක් තැබීමට නියම කළ පොතක යම් සාවද්‍ය සටහනක් සිදු කරන හෝ ප්‍රඥප්තිය මගින් සිදු කිරීමට නියම කර ඇති සටහනක් ඔහු විසින් ඒ පොතේ සඳහන් කිරීමට අපොහොසත් වීම;

(ඒ) තමා වෙත උකස් කර ඇති සියලු භාණ්ඩවල සම්පූර්ණ වටිනාකමේ ප්‍රමාණයට ස්වකීය ව්‍යාපාරය රක්ෂණය කර තැබීමට අපොහොසත් වීම;

(ක) ප්‍රඥප්තියේ විධිවිධාන කිසිවක් උල්ලංඝනය කිරීම හෝ ප්‍රඥප්තිය මගින් සිදු කිරීමට ඔහුට නියම කර ඇත්තේ යම් දෙයක් ද ඒ දේ සිදු කිරීමට අපොහොසත් වේ නම්; හෝ

(ග) ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ පළාත් ආදායම් කොමසාරිස්වරයාට වාර්ෂික ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අපොහොසත් වේ නම්;

එවැනි සෑම බඩු උකස්ගන්නා තැනැත්තෙකුම වරදකට වරදකරු විය යුතු ය.

42. (1) සේදීමට, පිරිසිදු කිරීමට, මැදීමට, අලුත්වැඩියා කිරීමට, සෑදීමට, වැඩ දැමීමට, නිම කිරීමට හෝ අලංකාර කිරීමට යම් තැතැන්තකුට භාර දෙන ලද යම් ලිනන් ඇගළුම් නිමවා නොමැති භාණ්ඩ හෝ ද්‍රව්‍ය දැනුවත්ම උකස් කිරීමට භාර ගන්නා සෑම බඩු උකස්ගන්නකුම වරදකට වරදකරු විය යුතුය. — ලිනන් රෙදිපිළි නොනිමැවූ භාණ්ඩ ආදිය.

(2) මේ වගන්තිය යටතේ, යම් අධිකරණයක් විසින් යම් බඩු උකස්ගන්නකු වරදකට වරදකරු කරනු ලබන

අවස්ථාවක දී, ඒ වරද සඳහා ඒ අධිකරණයක් විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දණ්ඩනයකට අමතරව අධිකරණය ඉදිරිපිට දී හෝ අධිකරණය විසින් නියම කරන පරිදි වෙනත් යම් ආකාරයකට ඔඩපනයේ අයිතිකරුට ඔඩපනයේ අයිතිය ආපසු පවරන ලෙසට බඩු උකස්ගන්නාට අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකිය.

බඩු උකස්ගන්නාගේ බැරට පවතින මුදලක් තැන්පත් කිරීමට බඩු උකස්ගන්නා අපොහොසත් වීම.

43. 34 වන වගන්තිය මගින් නියම කර ඇති පරිදි බඩු උකස්කරන්නාගේ බැරට පවතින මුදලක් පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත තැන්පත් කිරීමට අපොහොසත් වන සෑම බඩු උකස්ගන්නකුම වරදකට වරදකරු විය යුතු අතර යම් අධිකරණයක් විසින් ඒ වරද සඳහා යම් බඩු උකස්ගන්නකු වරදකට වරදකරු කරනු ලබන අවස්ථාවක දී, ඒ වරද සඳහා ඒ අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව අධිකරණය විසින් පනවනු ලැබූ දඩයක් ලෙස ඒ මුදලට සමාන මුදලක් බඩු උකස්ගන්නාගෙන් අයකර ගනු ලැබීමට අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකිය. එවැනි යම් මුදලක් අධිකරණය විසින් අයකරගනු ලබන විට අරමුදලේ තැන්පත් කරනු ලැබිය යුතු ය.

බඩු උකස්ගන්නාගේ සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සිදුකරන වැරදි.

44. බඩු උකස්ගන්නාගේ ව්‍යාපාර කටයුත්තක දී හෝ ව්‍යාපාරයකට අදාළව බඩු උකස්ගන්නාගේ සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සිදු කරන ලද හෝ සිදු නොකර හරින ලද යම් ක්‍රියාවක් බඩු උකස්ගන්නා විසින් අවස්ථාචෝචිත පරිදි සිදු කිරීමක් හෝ නොකර හැරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුවද, බඩු උකස්ගන්නා සාප්පුවෙන් හෝ ව්‍යාපාරික ස්ථානයෙන් බැහැරව සිටින අවස්ථාවක දී ප්‍රඥප්තියේ විධිවිධාන කිසිවක් උල්ලංඝනය වන පරිදි බඩු උකස්ගන්නාගේ යම් සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් යම් ක්‍රියාවක් කරන ලද හෝ නොකර හරින ලද අවස්ථාවක දී ක්‍රියාව ඒ සිදුකිරීම හෝ නොකර හැරීම සම්බන්ධයෙන් ඒ සේවකයා හෝ අනුයෝජිතයා වරදකට වරදකරු විය යුතු ය.

දණ්ඩන.

45. (1) ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරන්නේ යම් තැනැත්තෙක් ද, එවැනි සෑම තැනැත්තෙකුම රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාල සීමාවක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

(2) (1) වන උප වගන්තිය යටතේ අධිකරණයක් විසින් අය කර ගත් සහ රැස්කර ගත් දඩ මුදල් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

"

බඩු උකස්ගන්නා විසින් නීති විරෝධී ලෙස අත් කරගත් භාණ්ඩ.

46. ප්‍රඥප්තිය යටතේ ගොනු කරන ලද යම් නීති කෘත්‍යයක දී, බඩු උකස්ගන්නා විසින් නීති විරෝධී ලෙස භාණ්ඩයක් අත්කරගෙන ඇති බවට අධිකරණයට වාර්තා වන අවස්ථාවක දී, ඒ භාණ්ඩය ඉදිරිපත් කරන ලෙසට සහ අධිකරණය විසින් සුදුසු යැයි සිතන පරිදි යම් නියමයන් යටතේ ඒ අධිකරණය විසින් නම් කරන ලද යම් තැනැත්තෙකුට එය බාරදෙන ලෙසට නියම කිරීමට ඒ අධිකරණයට නිසි අධිකරණ බලය තිබිය යුතුය.

## VI වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

නම් කිරීම.

47. (1) බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය ඔහුගේ මරණින් පසු ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව 6 වන වගන්තිය යටතේ නම් කරන ලද තැනැත්තකුට පවරනු ලැබිය යුතු ය.

(2) බඩු උකස්ගන්නාට කලින් නම් කළ තැනැත්තා මියගිය අවස්ථාවක දී සහ ඒ බඩු උකස්ගන්නා විසින් කිසිදු තැනැත්තකු නම් කර නොමැති අවස්ථාවක දී ඒ බඩු උකස්ගන්නාගේ මරණින් පසු පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරය ඇවර කිරීමට තැනැත්තකු පත් කළ යුතුය.

(3) *(අ)* බඩු උකස්ගන්නා යම් අශක්නුතාවයක් හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ව්‍යාපාර කරගෙන යාමට නොහැකි වන අවස්ථාවක දී, ඒ බඩු උකස්ගන්නා විසින් යම් තැනැත්තකු පත්කරනු ලැබිය හැකි ය. ඒ පත්කිරීම 4 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව සිදු කරනු ලැබිය යුතු ය.

*(ආ)* පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ඒ නාමිකයා ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

(4) (1) වන හෝ (3) වන උපවගන්තිය යටතේ බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරයක් පවරනු ලබන අවස්ථාවක දී, පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින්, සෑහීමකට පත් වීමෙන් පසු වත්කම් හා බැරකම් පවරනු

ලැබ ඇත්තේ යම් නාමිකයකුට ද ඒ නාමිකයාට බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) බඩු උකස්ගන්නා තැනැත්තකුගේ ව්‍යාපාරයක් හවුල් ව්‍යාපාරයක් විසින් කරගෙන යනු ලබන අවස්ථාවක දී, හවුල් ව්‍යාපාර ගිවිසුමේ ඒ ව්‍යාපාරය ඇවර කිරීමේ කාරණාවක දී බඩු උකස්කරන්නාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යම් විධිවිධාන ඇතුළත් කළ යුතු ය.

බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය පැවරීම.

48. (1) යම් බඩු උකස්ගන්නා තැනැත්තකු විසින් ස්වකීය බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය පැවරීමට අරමුණු කරන අවස්ථාවක දී ඒ බඩු උකස්ගන්නා තැනැත්තා විසින්

(අ) (මෙහි මින් මතු ''කරගෙන යන්නා'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ ව්‍යාපාරය කරගෙන යාමට අදහස් කරන්නේ යම් තැනැත්තකු ද ඒ තැනැත්තා පදිංචි ප්‍රදේශයේ පොලිස් ස්ථානය භාර නිලධරයාගෙන් ඔහුට එරෙහිව බලපැවැත්වෙන කිසිදු පැමිණිල්ලක් නොමැති බවට වූ සහතිකයක් ;

(ආ) බඩු උකස්ගන්නාට සහ ව්‍යාපාරය කරගෙන යන්නාට එරෙහිව අධිකරණයක කිසිදු අපරාධ නඩු කටයුත්තක් නොපවතින බවට වූ දිවුරුම් ප්‍රකාශයක් ; සහ

(ඇ) බේරුම් කළ යුතු සියළු ඔඩපනයක් සහ අවශ්‍ය වෙනත් යම් තොරතුරු, සමඟ

පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබ ඇත්තේ යම් බඩු උකස්ගන්නකු විසින් ද ඒ බඩු උකස්ගන්නා තැනැත්තා විසින් ඒ ඉල්ලීමේ දින සිට කිසිදු භාණ්ඩයක් උකස් කිරීම සඳහා භාර ගැනීම සිදු නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් සිදු කිරීමෙන් පසුව ඒ බඩු උකස්ගන්නා විසින් සතියක් ඇතුළත ඒ ව්‍යාපාරය කරගෙන යන්නාගේ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් දැන්වීමක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් දිනපතා පළවන පුවත්පතක පළ කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උප වගන්තියේ සඳහන් කරන ලද දැන්වීමක් ව්‍යාපාරයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක අලවනු ලැබිය යුතු ය.

(5) පළාත් අදායම් කොමසාරිස්වරයා විසින් සෑහීමට පත්වීමෙන් පසුව ව්‍යාපාරය කරගෙන යන්නාට බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරය ඇවර කිරීම.

49. (1) යම් බඩු උකස්ගන්නා තැනැත්තකු ස්වකීය ව්‍යාපාරය ඇවර කිරීමට අරමුණු කරන අවස්ථාවක දී ඒ බඩු උකස්ගන්නා විසින්,

(අ) ඔහුට එරෙහිව කිසිදු පැමිණිල්ලක් නොමැති බවට බලපැවැත්වෙන පරිදි ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇති පොලිස් ස්ථානභාර නිලධරයාගෙන් සහ බඩු උකස්ගන්නා පදිංචිව සිටින්නේ කුමන ප්‍රදේශයක ද, ඒ ප්‍රදේශයේ පොලිස් ස්ථානභාර නිලධරයාගෙන් සහතිකයක් ;

(ආ) ඔහුට එරෙහිව අධිකරණවල කිසිදු අපරාධ නඩු කටයුත්තක් නොපවතින බවට බල පැවැත්වෙන දිවුරුම් ප්‍රකාශයක් ; සහ

(ඇ) බේරුම් කළ යුතු සියළු ඔඩපනයන් සම්බන්ධයෙන් සියළු තොරතුරු සහ අවශ්‍ය වෙනත් යම් තොරතුරු සමඟ

පළාත් ආදායම් කොමසාරිස්වරයාට ඔහුගේ අරමුණ පිළිබඳව දැනුම් දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද බඩු උකස්ගන්නා විසින් පළාත් ආදායම් කොමසාරිස්වරයාට ඒ දැනුම් දීම කරන දිනයේ සිට කිසිදු භාණ්ඩයක් උකස් කිරීම සඳහා භාර ගැනීම නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ දැනුම් දීම සිදු කිරීමෙන් පසුව ඒ බඩු උකස්ගන්නා විසින් සතියක කාල සීමාවක් ඇතුළත ඔහුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය සහ බඩු උකස්ගන්නාගේ බලපත්‍ර අංකය සහ බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරය ඇවර කිරීමේ අරමුණ ඇතුළත් දැන්වීමක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් දිනපතා පළවන පුවත්පතක පළ කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ දැන්වීමක් ව්‍යාපාරික ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ඇලවිය යුතු ය.

(5) ඒ ඈවර කිරීම සිදුවිය යුත්තේ කවර නිලධරයකුගේ අධීක්ෂණය යටතේ ද ඒ නිලධරයා පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් නම් කළ යුතු ය.

ගෙවීම පැහැර හැරීම.

50. ප්‍රඥප්තියට හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවලට අනුව ඇපයක් ලෙස තැන්පතුවක් ඉදිරිපත් කිරීමට නියම කර ඇති යම් බඩු උකස්ගන්නකු විසින් යම් නිශ්චිත කාල සීමාවක් තුළ එසේ තැන්පතුවක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති අවස්ථාවක දී ඒ මුදල ඒ බඩු උකස්ගන්නා විසින් ගෙවීමට යටත් වන්නා වූ පැහැර හරින ලද ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

පැහැර ගැනීමක් කරන බඩු උකස්ගන්නකු වෙත කරන දැන්වීම.

51. (1) ප්‍රඥප්තිය යටතේ බඩු උකස්ගන්නකු විසින් ගෙවීමට යටත් වන්නේ යම් මුදලක් ද ඔහු විසින් ඒ මුදල ගෙවීම පැහැර හරින අවස්ථාවක දී, පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති ආකාරයට පැහැර හරින ලද එවැනි මුදලක් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙරාතුව IV වන උපලේඛනයේ දක්වා ඇති 'ආ' ආකෘතියේ නියම කර ඇති තොරතුරු සමඟ IV වන උපලේඛනයේ දක්වා ඇති 'අ' ආකෘතියේ දැන්වීමක් නිකුත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක් ලබන යම් බඩු උකස්ගන්නකු විසින් (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමෙන් දින දාහතරක් ඇතුළත ඒ මුදල ගෙවීමට විරෝධයක් දැක්විය හැකි අතර, පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ඒ විරෝධතාවය සලකා බැලිය යුතු අතර ඒ වෙනුවෙන් දෙන ඔහුගේ තීරණය අවසාන තීරණය විය යුතු ය.

එසේ වුවද, (1) වන උපවගන්තිය යටතේ පැහැර හරින්නෙකුට දැන්වීම නිකුත් කිරීමෙන් දින දාහතරක් ඇතුළත ක්‍රියා කිරීමට නොහැකි වූයේ රෝගීවීමක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් සාධාරණ හේතුවක් නිසා යැයි, පළාත් ආදායම් කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක දී ඔහු විසින් කාලය දීර්ඝ කිරීමක් ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමෙන් හෝ තීරණයෙන් දින දාහතරක් ඉකුත්වීමෙන් පසුව බඩු උකස්ගන්නා විසින් ගෙවීමට යටත් වන්නා වූ පැහැර හරින ලද යම් මුදලක් ඔහු විසින් ගෙවන අවස්ථාවක දී, පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින්, බඩු උකස්ගන්නා වෙත භාරදෙන ලද දැන්වීමේ සහතික කළ පිටපතක් සහ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද තොරතුරුවල සහතික කළ පිටපතක් සමඟ වන උපලේඛනයේ දක්වා ඇති 'ඇ' ආකෘතියෙන් වූ වාර්තාවක් නිකුත් කළ යුතු ය

(4) (3) වන උපවගන්තිය යටතේ නියමයක් හෝ නියෝගයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් බඩු උකස්ගන්නකුට එරෙහිව ද ඒ බඩු උකස්ගන්නා විසින් ඒ නියමය හෝ නියෝගයට අනුකූල වීමට අපොහොසත් වී ඇති අවස්ථාවක දී ඒ බඩු උකස්ගන්නා වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාල සීමාවක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

(5) සංශෝධිත පරිදි (68 වන අධිකාරිය වූ) කාලාවරෝධ ආඥා පනතේ විධිවිධාන, ඇපයක් ලෙස ගෙවිය යුතු යම් මුදලක් අය කර ගැනීමට අදාළ කර නොගත යුතු ය.

(6) මේ වගන්තියේ ''බඩු උකසගන්නා'' යන්නට සමාගමක හෝ පුද්ගල මණ්ඩලයක හෝ සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන නිලධරයා හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු හෝ සංස්ථාපිත නොවන මණ්ඩලයක සාමාජිකයකු හෝ නිලධරයකු ඇතුළත් වේ.

52. (1) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් යම් බඩු උකසගන්නකුට හෝ ඒ බඩු උකසගන්නාගේ යම් සේවකයකු හෝ අනුයෝජිතයකුට; පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් නියම කළ හැකි තොරතුරු.

(අ) නිශ්චිතව සඳහන් කරන ලද පොත්, දත්ත, ගිණුම්, වෙළඳ වාර්තා, තොග ලැයිස්තු, ලේඛන, වවුචර්, චෙක් පොත්, උකස් කුවිතාන්සි, ඔඩපන පොත්, ගිණුම් වාර්තා හෝ නිශ්චිතව සඳහන් කරන ලද කාල සීමාවක් තුල ඒ දැන්වීමේ සඳහන් කරන ලද වෙනත් යම් ලේඛන ඉදිරිපත් කිරීමට;

(ආ) ඒ බඩු උකසගන්නාගේ ව්‍යාපාරයට අදාළ යම් තොරතුරු සැපයීමට;

(ඇ) දැන්වීමේ සඳහන් කරන ලද ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේ දී යම් කාරණයක් විමර්ශනය කිරීමට ඔහුට හෝ බලයලත් තැනැත්තකුට පෙනී සිටින ලෙසට;

නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සඳහන් කරන ලද තොරතුරු සැපයීමට දැන්වීමක් භාරදෙන අවස්ථාවක දී, ඒ නියෝගවලට අනුකූල වීම බඩු උකසගන්නා හෝ ඒ බඩු උකසගන්නාගේ යම් සේවකයකු හෝ අනුයෝජිතයකුගේ කාර්යය විය යුතු ය.

(3) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් යම් පොත්, දත්ත, ගිණුම්, විකුණුම් ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, වවුචර්, චෙක් පොත්, උකස් කුවිතාන්සි, ඔඩපන පොත්, ගිණුම් වාර්තා හෝ වෙනත් ලේඛන යම් කාල සීමාවක් සඳහා ඔහුගේ භාරයට ගනු ලැබිය හැකිය.

53. පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් හෝ පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරය ඇතිව මිස ප්‍රඥප්තිය යටතේ යම් වරදක් සඳහා කිසිදු නඩු පැවරීමක් නොකළ යුතුය. නඩු පැවරීම.

54. (1) තමාගේ තත්ත්වය හෝ ධුරය හේතුවෙන් වාර්තාවලට, දත්තවලට, ලේඛනවලට, ලිපිවලට හෝ ඒ ව්‍යාපාරයේ වෙනත් යම් කරුණුවලට යම් ප්‍රවේශයක් ඇති සෑම බඩු උකසගන්නකු හෝ ඔහුගේ සේවකයකු හෝ අනුයෝජිතයකු හෝ ඒ බඩු උකසගන්නා ව්‍යාපාරයේ නිලධාරයකු සහ සෑම තැනැත්තකුම ඒ දත්තවල, ලේඛනවල, ලිපිවල හෝ ඒ ව්‍යාපාරයේ වෙනත් යම් කරුණුවල ඇති අන්තර්ගතයන් සම්බන්ධයෙන් පරම විශ්වාසය සුරැකිය යුතුය. රහස්‍ය භාවය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද සෑම තැනැත්තකුම ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් යම් තොරතුරු යම් පුද්ගලයකුට, සංස්ථාවකට, බැංකුවකට, අධිකරණයකට, ආයතනයකට, අස්තිත්වයකට, දෙපාර්තමේන්තුවකට, නිලධරයකුට, අනුයෝජිතයකුට, ශ්‍රී ලංකා රජයේ අනුයෝජිතයකුට හෝ වෙනත් යම් තැනැත්තකුට හෙළිදරව් කිරීමේ දී හෝ අනාවරණය කිරීමේ දී,

(අ) ඒ ව්‍යාපාරයේ බඩු උකසගන්නා හෝ ඒ භාණ්ඩය උකස්කරන්නා විසින් එසේ කිරීමට තමගේ අවසරය දී ඇත්නම් මිස;

(ආ) බඩු උකසගන්නා විසින් හෝ ඔහුට එරෙහිව හෝ බඩු උකස්කරන්නා විසින් හෝ ඔහුට එරෙහිව නඩු කටයුත්තක් පවරා ඇත්නම් මිස; හෝ

(ඇ) යම් නීතියක විධිවිධාන කිසිවකින් එසේ කිරීමට ඔහුට නියම කර ඇත්නම් මිස, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් එළිදරව් කිරීමකට හෝ අනාවරණය කිරීමකට අවසර නොදිය යුතුය.;

55. (1) (මෙහි මින් මතු '' අමාත්‍යවරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) මුදල් විෂය පවරා ඇති පළාත් සභා මන්ත්‍රීවරයා විසින් ප්‍රඥප්තියේ විධිවිධාන පවත්වාගෙන යාමේ හෝ ඒවාට බලාත්මකභාවය ලබා දීමේ කාර්යය සඳහා නියෝග සාදනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව අමාත්‍යවරයා විසින් පහත දක්වෙන,

(අ) ප්‍රඥප්තිය යටතේ සෑදීමට නියම කරන ලද හෝ බලය දෙන ලද නියෝග සම්බන්ධයෙන් වූ සියලු කාරණා

(ආ) ප්‍රඥප්තිය යටතේ භාරදීමට නියම කරන ලද යම් වාර්තාවක ඇතුළත් කළ යුතු තොරතුරු;

(ඇ) පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් තැබිය යුතු සහ පවත්වාගෙන යායුතු පොත්පත් සහ ලේඛන හා ඒවායේ ඇතුළත් කළ යුතු තොරතුරු;

(ඈ) බඩු උකස් ගැනීමේ ව්‍යාපාරයක් කරගෙන යෑමට අවශ්‍ය ලියාපදිංචි ගාස්තු; සහ

(ඉ) බලපත්‍රලාභියෙකු විසින් සැපයිය යුතු ගාස්තු, ඇප තැන්පතු සහ ඇප ගාස්තු තැන්පත් කිරීමේ ආකාරය.

යන කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් වෙනුවෙන් නියෝග සාදනු ලැබිය හැකිය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සියලු නියෝග ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර (ඒ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් මාස තුනක් ඇතුළත) අනුමැතිය සඳහා උතුරු මැද පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

(4) උතුරු මැද පළාත් සභාව විසින් අනුමත කර නොමැති සෑම නියෝගයක්ම ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවෙකුට අගතියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට පරිච්ජින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(5) යම් නියෝගයක් පරිච්ජින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු දිනය පිළිබඳ නිවේදනය කරනු ලැබිය යුතුය.

බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරයක් කරගෙන යන්නෙකු ලෙස සලකනු ලැබිය යුතුය.

56. ගිවිසුමක් හෝ ප්‍රකාශිත හෝ ගම්‍ය වූ අවබෝධයක් යටතේ භාණ්ඩ මිලට ගන්නා, භාරගන්නා හෝ ලබා ගන්නා සහ යම් කොන්දේසි මත එම භාණ්ඩ බේරුම් කළ හැකි හෝ මිලදී ගත හැකි බවට සාධාරණ ලෙසට අනුමාන කරන ලද ගනුදෙනු ස්වාභාවයෙන් සහ ගනුදෙනු ආකාරයෙන් ඒ භාණ්ඩ වෙනුවෙන් යම් මුදලක් ගෙවන, අත්තිකාරම් වශයෙන් ලබාදෙන හෝ භාණ්ඩ මිලදී ගැනීම හෝ විකිණීම සඳහා හෝ ඒ භාණ්ඩ මත ලබා දෙන ලද අත්තිකාරම් මුදල් සඳහා ඇපයක් ලෙස භාණ්ඩ ලබා ගැනීම සඳහා සාප්පුවක් පවත්වාගෙන යන්නා වූ යම් තැනැත්තකු උකස් ව්‍යාපාරයක් කරගෙන යන තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු අතර වැඩිදුරටත් එවැනි සියලු ගනුදෙනු, භාණ්ඩ සහ ණය ප්‍රඥප්තියේ අර්ථානුකූල උකස් ගැනීමක්, ඔඩපනයක් සහ ණයක් ලෙස සලකනු ලැබිය යුතුය.

ශේෂ කිරීම

57. (අ) ප්‍රඥප්තියේ කුමක් සඳහන් වුවද. (මෙහි මින් මතු '' අඥපනත'' යනුවෙන් සඳහන් කරනු ලබන) සංශෝධිත පරිදි 1942 අංක 13 දරන (90 වන අධිකාරිය වූ) උක්ස්ගන්නන්ගේ ආඥපනත යටතේ සාදන ලද සෑම නියෝගයක දීම, ප්‍රඥප්තිය ආරම්භ වන දිනයේ සිට මේ දක්වා ඒ නියෝග මේ ප්‍රඥප්තියේ විධිවිධාන සමග අනනුකුල නොවන, මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද ඒවා ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ නියෝග ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝගවලින් සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකිය ;

(ආ) ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම දිනයේ පළාත තුළ දී ආඥ පනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට බලාත්මක විය යුතු අතර ප්‍රඥප්තියේ 6 වන වගන්තිය යටතේ නිකුත් කළ යුතු බලපත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම දිනයේ පළාත තුළ දී ආඥපනතේ 23 අ වගන්තිය යටතේ බඩු උකසගන්නකු විසින් සපයනු ලබන සියලු ඇප ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට බලපැවැත්වෙන පරිදි මේ ප්‍රඥප්තියේ 7 වන වගන්තිය යටතේ සපයනු ලැබූ ඇප ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව දිනයේ පළාත තුළ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ බඩු උකස්ගන්නකු විසින් හෝ ඔහුට එරෙහිව පවරන ලද සහ පවරනු ලැබෙන සියලු නඩු කටයුතු සහ නීති කෘත්‍යයන් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට බල පැවැත්වෙන පරිදි ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ අවස්ථාවෝචිත පරිදි බඩු උකස්ගන්නකු විසින් හෝ ඔහුට එරෙහිව පවරන ලද නඩු කටයුත්තක් සහ නීති කෘත්‍යයන් ලෙස සැලකිය යුතු අතර ඒ අනුව අඛණ්ඩව පවත්වා අවසන් කළ හැකිය ; සහ

(ඉ) ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව දිනයේ පළාත තුළ බඩු උකස්ගන්නන්ගේ ආඥාපනත යටතේ බඩු උකස්ගන්නන්ගේ සියලු බැරකම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට බලපැවැත්වෙන පරිදි ඒ බඩු උකස්ගන්නාගේ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය.

58. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියේ - අර්ථ නිරූපනය.

''ව්‍යාපාර ස්ථානය'' යන්නට බඩු උකස්ගන්නකු විසින් ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන්නේ කවර ස්ථානයක ද ඒ නිවාසයක්, ගබඩා කිරීමේ නිවාසයක්, සාප්පුවක්, සමාගමක්, බද්ද ව්‍යාපාරයක්, හවුල් ව්‍යාපාරයක් සහ ස්ථානයක් සහ බඩු උකස් ගැනීම පවත්වාගෙන යන්නේ යම් ශාඛාවක ද එවැනි ශාඛා පිහිටි යම් ස්ථානයක් ඇතුළත් වේ.

''ලේකම්වරයා'' යන්නෙන් උතුරු මැද පළාතේ ප්‍රධාන ලේකම්වරයා අදහස් වේ ;

''විදේශීය සමාගමක්'' යන්නෙන් ශ්‍රී ලංකාව තුළ බඩු උකස් ගැනීමේ ව්‍යාපාර ස්ථානයක් පිහිටුවනු ලැබ ඇති සහ ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති බඩු උකස් ගැනීමේ ව්‍යාපාර ස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යන්නා වූ ශ්‍රී ලංකාවෙන් බැහැර යම් සමාගමක් හෝ සංස්ථාපිත පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

''විදේශීය ආයතනයක්'' යන්නෙන්,

(i) ලංකාවේ පුරවැසියකු නොවන එක් තැනැත්තකුගෙන් හෝ දෙදෙනාම එම පුරවැසියන් නොවන හවුල් ව්‍යාපාරිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත හෝ

(ii) අවම වශයෙන් එක් සාමාජිකයකු ශ්‍රී ලාංකිකයකු නොවන හවුල් ව්‍යාපාරිකයන් දෙදෙනෙකුට වැඩියෙන් සමන්විත ;

සමාගමක් අදහස් වේ.

''බඩු උකස්කරන්නා'' යන්නෙන්, බඩු උකස්ගන්නකු වෙත උකස් කිරීම සඳහා භාණ්ඩයක් භාරදෙන තැනැත්තෙකු අදහස් වේ ;

''ඔඩපනය'' යන්නෙන්, බඩු උකස්ගන්නෙකු වෙත උකස් කරන ලද භාණ්ඩයක් අදහස් වේ ;

''උතුරු මැද පළාත් අදායම් කොමසාරිස්වරයා'' යන්නෙන්, 1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පත්කරන ලද පළාත් ආදායම් කොමසාරිස්වරයා අදහස් වේ ;

''නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස්වරයා'' යන්නෙන් 1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පත්කරන ලද නියෝජ්‍ය ආදායම් කොමසාරිස්වරයා අදහස් වේ ;

''පළාත් සභා අරමුදල'' යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වන වගන්තිය යටතේ උතුරු මැද පළාතේ පිහිටුවන ලද පළාත් සභා අරමුදල අදහස් වේ ;

''තැනැත්තකු'' යන්නට සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන යම් පුද්ගල මණ්ඩයක් ඇතුළත් වේ ;
''පළාත් සභාව'' යන්නෙන්, උතුරු මැද පළාත් සභාව අදහස් වේ.

''ශ්‍රී ලාංකික පුරවැසියකු'' යන්නෙන්, උපතින් හෝ නීතියෙන් ශ්‍රී ලාංකික පුරවැසියකු බවට පත්වන යම් තැනැත්තකු අදහස් වේ.

59. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකුලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකුලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

(6 වන වගන්තිය)

**I වන උපලේඛනය**

**"අ" ආකෘතිය**

**බලපත්‍රය**

අංකය: .............................................

.................................................................................................................................................................. දිස්ත්‍රික්කයේ
.................................................................................................................................................................. සීමාව තුළ
.................................................................................................................................. දී උකස් ව්‍යාපාරයක් කරගෙන යාමට උතුරු මැද පළාත් සභාවේ 2017 අංක .................................................................. දරන බඩු උකස්ගන්නන්ගේ ආඥාපනතේ විධිවිධාන යටතේ බලපත්‍රයක් උතුරු මැද පළාතේ ආදායම් කොමසාරිස්වරයා වන මා විසින් මෙයින් නිකුත් කරමි.

.................................................................. දින මේ බලපත්‍රයේ වලංගුභාවය ඉකුත් වේ.

දිනය ...................................................................

...................................................................

පළාත් ආදායම් කොමසාරිස්වරයා

(මුද්‍රාව)

(21 වන වගන්තිය)

**''ආ'' ආකෘතිය**

**ඔඩපන පොත**

........................................................ ඔඩපන පොත ................................................... බඩු උකස්ගන්නා

| ටොක් කුටිනාන්සියේ අංකය හා නිකුත් කළ දිනය | මායයක් තුළ සිදු කළ ඔඩපන සංඛ්‍යාව | එක් එක් භාණ්ඩය සඳහා දුන් ණය මුදල | එක් එක් භාණ්ඩය මත අය කළ පොළී ලාභය | බඩු උකස්කරන්නාගේ නම | බඩු උකස්කරන්නාගේ ලිපිනය | බඩු උකස්කරන්නා අයිතිකරු නොවේ නම් අයිතිකරුගේ නම | උකස් කරන ලද එක් එක් භාණ්ඩයේ විස්තර | භාණ්ඩ හෝ ආභරණ වල බර | උකස් කරන ලද එක් එක් භාණ්ඩයේ වටිනාකම | බේරුම් කරන දිනය | බේරුම් කරන තැනැත්තාගේ නම සහ ලිපිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. | | | | | | | | |

(21 වන වගන්තිය)

''ඇ'' ආකෘතිය

**ඔඩපන විකුණුම් පොත**

.................................................................... ඔඩපනය ........................................................ බඩු උකස්කරු

විකුණුම් දිනය සහ ස්ථානය ..........................................................................................................

වෙන්දේසිකරුගේ නම සහ ලිපිනය ..............................................................................................

| ඔඩපන පොතේ සඳහන් පරිදි ඔඩපන සංඛ්‍යාව | උකස් කරන දිනය | උකස් කරන්නාගේ නම | ණය මුදල රු. ශත | නියමිත පොළී මුදල රු. ශත | වෙන්දේසිකරු විසින් ඔඩපන විකුණූ මුදල රු. ශත | ගැණුම්කරුගේ නම සහ ලිපිනය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

(22 වන වගන්තිය)

''ඈ'' ආකෘතිය

උකස් කුවිතාන්සිය

පිලිපත් අංකය:- .............................................

(බඩු උකස් ගන්නා විසින් රඳවා ගත යුතු ය)

දිනය, ..........................................................

බඩු උකස් ගන්නාගේ නම සහ ලිපිනය

.....................................................................

.....................................................................

.....................................................................

.....................................................................

.....................................................................

බඩු උකස් කරන්නාගේ නම සහ ලිපිනය

ජාතික හැඳුනුම්පත් අංක ........................ දරන

පහත අත්සන් කරන .....................................

වන මා විසින් රුපියල් .................................

සඳහා රුපියල් ..............................................

වටිනා .........................................................

ඉහත කී බඩු උකස් ගන්නා වෙත .........................

වන දින උකස් කරන ලදී.

අත්සන ........................................................

(අත්සන් කිරීමට නොහැකි නම් මාපට ඇඟිලි සලකුණ තබන්න.)

මුල් පිලිපතේ අංකය:- .......................................

දිනය: ...........................

පහත අත්සන් කරන ලද (බඩු උකස් ගන්නාගේ නම සහ ලිපිනය)

.....................................................................

.....................................................................

.....................................................................

බඩු උකස්කරන්නාගේ නම සහ ලිපිනය

.....................................................................

.....................................................................

.....................................................................

රුපියල් ........................................................

සඳහා රුපියල් ................................................

වටිනා ..........................................................

වන දින උකස් කරන ලදී.

බඩු උකස්ගන්නාගේ හෝ බඩු උකස්ගන්නාගේ සේවකයකු හෝ අනුයෝජිතයකුගේ අත්සන.

නම .......................................................

අත්සන ........................................................

(මුද්‍රාව)

(26 වන වගන්තිය)

''ඉ'' ආකෘතිය

**26, 3 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන උකස් කුවිතාන්සි පත්‍රිකාව බඩු උකස්කරන්නාගේ අත්සන ඒ මත පිටසන් කිරීමකින් තොරව ඉදිරිපත් කරන අවස්ථාවක ප්‍රකාශය.**

උතුරු මැද පළාත් සභාවේ 2017 අංක ................................ දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තියට අනුකූලව ජාතික හැඳුනුම්පත් අංකය/ විදේශ ගමන් බලපත්‍ර අංකය .......................... දරන ............................ වන මම පහත විස්තර කර ඇති භාණ්ඩය/ භාණ්ඩ බඩු උකස්ගන්නාගේ ....................... සාප්පුවේ දී ......................... ඔඩපන සිදු කළ බවත්, ඒ සඳහා උකස් කුවිතාන්සි පත්‍රිකාව ලැබුන බවත්, එකී (බඩු උකස්කරන්නා) ......................... ගේ අත්සන එකී (බඩු උකස්කරන්නා) .............................. ගේ මිය යාම නිසා/නෛතික අශක්නුතාවයක් යටතේ සිටින .............................. (නෛතික අශක්නුතාවයේ ස්වභාවය) බැවින් ඒ කුවිතාන්සි පත්‍රිකාව මත නිසි ආකාරයෙන් පිටසන් කර ඔඩපනය බේරුම් කිරීමේ කාර්යය සඳහා මා හට ඒ උකස් පත්‍රිකාව බඩු උකස්ගන්නා වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බවට ගම්භීරතා පූර්වකව සහ අවංකව ප්‍රකාශ කර සිටිමි.

.........................................................

අත්සන.

ඉහත සඳහන් කරන ලද භාණ්ඩය/ භාණ්ඩ

....................................................................................................................

එකී ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව ................................................................................................... වන මා

ඉහතින් වූ ප්‍රකාශය සිදු කරන ................................................................................................................................ යන

තැනැත්තා හොඳින් දන්නා හඳුනන බවට ගම්භීරතා පූර්වකව සහ අවංකව ප්‍රකාශ කර සිටිමි.

අත්සන ..........................................................................

20 ................................ මස ............................ දින

මා ඉදිරිපිට ප්‍රකාශ කරන ලදී.

සාමදාන විනිශ්වයකාර/දිවුරුම් කොමසාරිස්.

(මුද්‍රාව)

(28 වන වගන්තිය)

''ඊ'' ආකෘතිය

**උකස් කුවිතාන්සි පත්‍රිකාව නැති වීම ආදී අවස්ථාවල දී ප්‍රකාශය.**

(සැලකිය යුතුයි. මෙම ප්‍රකාශය සාවද්‍ය වේ නම් ප්‍රකාශය සිදු කරන තැනැත්තා නීතියෙන් දඬුවම් ලැබිය යුතු ය.)

උතුරු මැද පළාත් සභාවේ 2017 අංක ................................ දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තියට අනුකූලව ජාතික හැඳුනුම්පත් අංකය/ විදේශ ගමන් බලපත්‍ර අංකය .......................... දරන ............................ වන මම පහත විස්තර කර ඇති භාණ්ඩය/ භාණ්ඩ බඩු උකස්ගන්නාගේ ....................... සාප්පුවේ දී ............................................ ඔඩපනය සිදු කළ බවත්, ඒ සඳහා උකස් කුවිතාන්සි පත්‍රිකාව ලැබුණ බවත්, .................................... සිට එකී උකස් කුවිතාන්සි පත්‍රිකාව ............................... (ඉදිරිපත් කිරීමට නොහැකි වීමට හේතු) ඇති නිසා ඔඩපනය බේරුම් කිරීමේ කාර්යය සඳහා මා හට බඩු උකස්ගන්නා වෙත ඒ උකස් කුවිතාන්සි පත්‍රිකාව ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බවත්, මාගේ දැනුමට හා විශ්වාසයට අනුව කිසිදු තැනැත්තකුට ඒ උකස් කුවිතාන්සි පත්‍රිකාව විකුණනු හෝ පවරනු ලැබ නොමැති බවටත්, ගාම්භීරතා පූර්වකව සහ අවංකවව ප්‍රකාශ කර සිටිමි.

ගේ අත්සන ........................................................

එකී ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව ඇ ඇ ........................................................................................................ වන මා ඉහතින් වූ ප්‍රකාශය සිදු කරන ........................................................................................................ යන තැනැත්තා හොඳින් දන්නා හඳුනන බවට ගාම්භීරතා පූර්වකව සහ අවංකව ප්‍රකාශ කර සිටිමි.

අත්සන ..........................................................................

20 ................................ මස ............................. දින

මා ඉදිරිපිට ප්‍රකාශ කරන ලදි.

.................................................................................

සාමදාන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්

(මුද්‍රාව)

(32 වන වගන්තිය)

"උ" ආකෘතිය

**කුවිතාන්සිය**

දිනය ……………………

අංක …………………………………… දරන ඔඩපනය බේරුම් කිරීම මත වූ ලැබීම්

| | රු. ශත |
|---|---|
| ණය මුදල | ………………………… |
| පොළී ලාභය | ………………………… |
| ව්‍යාපාර පිරිවැටුම් බදු | ………………………… |
| මුළු මුදල | ………………………… |

…………………………

බදු උකස්ගන්නාගේ අත්සන.

(32 වන වගන්තිය)

## II වන උපලේඛනය

**පොළී අනුපාතය**

පොළී අනුපාතය සෑම මාසයකම හෝ එයින් කොටසක් සඳහා ................................ විය යුතු ය.

**බදු ගෙවීම**

ඔඩපනයක් වෙනුවෙන් ප්‍රදනය කරන ලද ණය මුදලක් මත බඩු උකස්ගන්නා විසින් යම් ලිඛිත නීතියක් යටතේ වූ බද්දක් ගෙවන අවස්ථාවක දී ඒ බද්ද බඩු උකස්කරන්නාගේ අය කරනු ලැබිය යුතු ය.

**වැඩි කරන ලද පොලිය අයකර ගැනීම සීමා කිරීම**

යම් දිනයක සිට පොළිය වැඩි කිරීමට බඩු උකස්ගන්නා හිමිකම් ලබන අවස්ථාවක දී බඩු උකස්කරන්නා විසින් ඒ දිනයට පෙරාතුව ඔඩපනය බේරුම් කිරීමට ඔහු අපොහොසත් වූයේ, ඒ දිනයට පෙර දිනයේ පෙරවරු 8.00 ත් පස්වරු 8.00 ත් අතර කාලය තුළ බඩු උකස්ගන්නාගේ සාප්පුව වසා තැබීමේ හේතුව නිසා බව අධිකරණ බලය ඇති සිවිල් අධිකරණයක් ඉදිරිපිට දී හේතු දක්වා සිටින්නේ නම් ඒ වැඩිකරන ලද පොළිය අයකර ගනු නොලැබිය යුතු ය.

උකස් කුවිතාන්සියට අදාළ ඔඩපනය එය උකස් කරන ලද දිනයේ සිට මාස දොළහක කාල සීමාවක් තුළ දී බේරුම් කිරීමට නොහැකි වන්නේ නම් එය ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණීමට යටත් විය යුතු ය.

විකිණීමෙන් උපයාගත් යම් අතිරික්ත ලාභයක් පවතින්නේ නම් සහ ඒ විකිණීමේ දින සිට වසරක කාල සීමාවක් තුළ බඩු උකස්කරන්නා විසින් හිමිකම් පෑමක් සිදු කර නොමැති නම් එකී ලාභය පළාත් සභා අරමුදලේ බඩු උකස්කරන්නාගේ බැරට තැන්පත් කළ යුතු ය.

(33 වන වගන්තිය)

## III උපලේඛනය

ඔඩපනයක් වෙන්දේසි කිරීමට අදාළ නියෝග

(1) වෙන්දේසිකරු විසින් සියලුම ඔඩපනයක් මහජන ප්‍රදර්ශනයට විවෘතව තැබිය යුතුය.
(2) වෙන්දේසිකරු විසින්,
(අ) බඩු උකස්ගන්නාගේ නම සහ ව්‍යාපාරික ස්ථානය;
(ආ) එක් එක් ඔඩපනයක් උකස් කරනු ලැබුවේ කුමන මාසයකද, ඒ මාසය; සහ
(ඇ) උකස් කරන කාල සීමාවේදී ඔඩපන පොතේ ඇතුළත් කළ පරිදි එක් එක් ඔඩපනයේ අංකය.
ඇතුළත් කරමින් ඔඩපන නාමාවලියක් ප්‍රකාශයට පත් කළ යුතුය.

(3) නාමාවලියේ ඇති එක් එක් බඩු උකස්ගන්නාගේ ඔඩපනයත් වෙනත් යම් බඩු උකස්ගන්නන්ගේ යම් ඔඩපනවලින් වෙන්කර තැබිය යුතුය.
(4) වෙන්දේසිකරු විසින්, සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි යන එක් එක් පුවත්පත්වල දැන්වීමක් පළකරමින් විකිණීම පිළිබඳ දැන්වීමක් කළ යුතුය. විකිණීම සිදු කරනු ලබන්නේ යම් ස්ථානයකද ඒ ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ ස්ථානවල ඒ දැන්වීම් ප්‍රදර්ශනය කළ යුතුය. ඒ දැන්වීම්වල පහත දැක්වෙන තොරතුරු ඇතුළත් කළ යුතුය.
(අ) බඩු උකස්ගන්නාගේ නම සහ ව්‍යාපාරික ස්ථානය;
(ආ) ඔඩපනයක් උකස් කරනු ලැබුවේ කුමන මාසයකද, ඒ මාසය

(5) දැන්වීම් එකම පුවත්පතේ දවස් දෙකක් පළකරනු ලැබිය යුතු අතර, දෙවන දැන්වීම පළමු විකුණුම් දිනයට අවම වශයෙන් දින දහයකට පෙරාතුව පළ කරනු ලැබිය යුතුය.
(6) විකිණීමකදී බඩු උකස්ගන්නා විසින් ලංසු තබන අවස්ථාවකදී වෙන්දේසිකරු විසින්, එම විකිණීම සඳහා වෙනත්

තැනැත්තන්ගේ ඔහු විසින් ලබා ගන්නා ලංසු තැබීම් හැර වෙනත් යම් ආකාරයකින් ලංසු තැබීම් භාර නොගත යුතුය. බඩු උකස්ගන්නා විසින් භාණ්ඩයක් මිලදී ගන්නා අවස්ථාවකදී වෙන්දේසිකරු විසින් නොපමාව ගැණුම්කරු ලෙස බඩු උකස්ගන්නාගේ නම ප්‍රකාශයට පත් කළ යුතුය.

(7) වෙන්දේසිකරු විසින් විකිණීමෙන් දින 14 ක් ඇතුළත බඩු උකස්ගන්නාගේ ඔඩපනය විකුණන ලද මිල සඳහන් කරමින් ඒ බඩු උකස්ගන්නාගේ ඔඩපනයට අදාළව වෙන්දේසිකරුගේ අත්සනින් සහතික කරන නාමාවලියේ පිටපතක් බඩු උකස්ගන්නාට භාර දිය යුතුය.

(8) බඩු උකස්ගන්නා විසින් අවම වශයෙන් වෙන්දේසියෙන් වසර දෙකක් පසුවන තෙක් එවැනි සෑම නාමාවලියක් ම ආරක්ෂා කළ යුතුය.

(51 වන වගන්තිය)

IV වන උපලේඛනය

'' අ'' ආකෘතිය

තැන්පතු පැහැර හැරීම වෙනුවෙන් බඩු උකස්ගන්නකු වෙත යවනු ලබන දැන්වීම්

පළාත් ආදායම් කොමසාරිස්
(කාර්යාලය)
..................................................................

...................................... මයා/ මිය,
........................................
........................................
ප්‍රිය මහත්මයාණනි/ මහත්මයානි,

බඩු උකස්ගන්නාගේ නම:-
ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය:-

ඇපයක් ලෙස තැන්පතු පැහැර හැරීම
බලපත්‍ර අංකය: ....................................................................

උතුරු මැද පළාත් සභාවේ 2017 අංක................................. දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ නියමයන්ට අනුකූලව ඔබ විසින් තැන්පතු ගෙවීම් පැහැර හැර ඇති බවට හෙළිදරව් වී ඇත. එයට අදාළ තොරතුරු මෙයට අමුණා ඇති 2 වන ආකෘතියේ දක්වා ඇත. ඔබ විසින් දැනටමත් මෙම තැන්පතු ගෙවා ඇත්නම් නොපමාව මා වෙත දැනුම් දෙන මෙන් ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

එය ප්‍රේෂණය කරනු ලැබ ඇත්නම් ඇත්නම් එයට බලපාන කුවිතාන්සි, ලේඛන හෝ ලිපි කරුණාකර මා වෙත ලැබෙන්න සලස්වන්න. ගෙවීම් සිදු කරනු ලැබ නොමැතිනම්, මෙයට අමුණා ඇති 'ආ' ආකෘතියේ දක්වා ඇති පරිදි සම්පූර්ණ මුදල පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ කාර්යාලයට ගෙවා ඉදිරි සති දෙක ඇතුළත මා වෙත දැනුම් දෙන ලෙසට නැතහොත් මේ දැන්වීම ලැබී දින 14 ක් තුළ දී පළාත් ආදයම් කොමසාරිස්වරයාගේ නමට ලියන ලද 'ආ' ආකෘතියේ දක්වා ඇති පරිදි සම්පූර්ණ මුදල ලියාපදිංචි තැපෑලෙන් චෙක්පතක් මඟින් කරුණාකර මා වෙත එවන මෙන් ඔබට මෙයින් දැනුම් දෙමි.
මේ දැන්වීමට අමුණා ඇති කරුණු පිළිබඳ වැඩිදුරටත් තොරතුරු ඔබට අවශ්‍ය නම් ඒ තොරතුරු මේ දැන්වීමේ දින සිට සති දෙකක කාල සීමාවක් තුළ මේ කාර්යාලයෙන් ඔබ විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මඟින් ගත හැකිය.

ඉදිරි සති දෙක තුළ ගෙවීම් සිදු කරන බවට ඔබගෙන් මේ දැන්වීම සඳහා කිසිදු ලිඛිත පිළිතුරක් හෝ ප්‍රතිචාරයක් නොමැති අවස්ථාවක දී ප්‍රඥප්තියේ නියමයන් අනුව පැහැර හරින ලද තැන්පතු අයකර ගැනීම සඳහා අධිකරණයේ දී ඔබට එරෙහිව නඩු කටයුත්තක් පවරනු ලබන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

.................................

පළාත් ආදායම් කොමසාරිස්.

පළාත් ආදායම් කොමසාරිස් කාර්යාලය.

.............................. (මුද්‍රාව)

දිනය ………………………………….

''ආ'' ආකෘතිය

51.(1) වන වගන්තිය යටතේ නියම කරන ලද තොරතුරු

1. පැහැර හරින බඩු උකස්ගන්නාගේ නම :……………………………………………………………………………….

2. ව්‍යාපාරික ස්ථානයේ නම සහ ලිපිනය :…………………………………………………………………………………

…………………………………………………………………………………………………………………………

3. බලපත්‍ර අංකය :…………………………………………………………………………………

4. පැහැර හරිනු ලැබ ඇති මුළු මුදල :…………………………………………….

5. පැහැර හැරීමේ කාල සීමාව :…………………………………………….

6. සිදු කරන ලද ගෙවීම් :…………………………………………….

7. ගෙවිය යුතු ශේෂය :…………………………………………….

…………………………….

පළාත් ආදායම් කොමසාරිස්වරයා.

මුද්‍රාව

පළාත් ආදායම් කොමසාරිස් කාර්යාලය.

…………………………………………….

…………………………………………….

දිනය ……………………………………

''ඇ'' ආකෘතිය

51 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ සහතිකය

1. පැහැර හරින බඩු උකස්ගන්නාගේ නම :……………………………………………………………………………….

2. ව්‍යාපාරික ස්ථානයේ නම සහ ලිපිනය :…………………………………………………………………………………

…………………………………………………………………………………………………………………………

3. තැන්පතු පැහැර හැරීමේ කාල සීමාව :.......................................................................................

4. පැහැර හරින ලද දයක මුදල් තැන්පතුවල එකතුව :..............................................

5. සිදු කරන ලද යම් ගෙවීමක් :..............................................

6. ගෙවිය යුතු ශේෂය :..............................................

................................

පළාත් ආදායම් කොමසාරිස්වරයා.

මුද්‍රාව

පළාත් ආදායම් කොමසාරිස් කාර්යාලය.

..................................................

..................................................

දිනය ........................................

01 - 303

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.